#mediaethicsSL #SinhalaPress #lka #SundayDivaina #HiruTv

ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සිලයේ නායක එන්.එම් අමීන් විසින් සඳහන් කළ බවට ඇතැම් ජනමාධ්‍ය මගින් කළ ප්‍රකාශයක් ඔස්සේ, සමාජ මාධ්‍ය ජාලා තුළ එන්.එම්.අමීන්ව සහ සමස්ත මුස්ලිම් ප්‍රජාවම දැඩි දෝෂදර්ශනයකට පාත්‍රව තිබිණි. මෙහිදී ඇතැම් ජනමාධ්‍ය මගින් සඳහන් කොට තිබුණේ, "සෑම මුස්ලිම් නිවසකට පාහේ කඩුවක් තිබෙන බාත්, ඒ ආත්මාරක්ෂාව සඳහා -විශේෂයෙන්ම නිවෙස් වල සිටින ගැහැණු දරුවන් ආරක්ෂා කර ගැනීම සඳහා" යැයි ඔහු පැවසූ බවටයි. අමීන් මහතාගේ ප්‍රකාශය ඇතුළත් සංස්කරණය කරන ලද වීඩියෝ පටයක්ද මේ සමගින්ම සංසරණය විණි.

කෙසේ වෙතත් මෙම අදහස එන්.එම්.අමීන් පැවසූ බවට වන අදහස සාවද්‍ය බව, සංස්කරණය නොකළ සම්පූර්ණ වීඩියෝව නරඹන විට හෙළිවේ. ලක්බිම පුවත්පත මගින්ද නිවැරදිව දක්වා ඇති ආකාරයට, මෙහිදී එන්.එම්.අමීන් විසින් සිදුකරන්නේ ජනාධිපතිවරයා විසින් පොලිස්පතිවරයා අමතමින් කරනු ලබන ප්‍රකාශය උපුටා දැක්වීමකි. එනමුත් ඇතැම් ජනමාධ්‍ය මගින් එය සංස්කරණය කොට පළ කරමින් සිතාමතාම ප්‍රේක්ෂකයාව/පාඨකයාව නොමග හැරීමක් සිදු කරයි.

මෙහිදී කඩවන මාධ්‍ය ආචාර ධර්මය වන්නේ නොමග යවන සුළු පුවත් පළ කිරීම පමණක් නොවේ. මෙවන් මොහොතක වාර්ගික අසමගියට, ප්‍රචණ්ඩත්වයට තුඩු දෙන ආකාරයේ ජනමාධ්‍ය හැසිරීමද බරපතල ආචාර ධාර්මික උල්ලංඝනයක් වන බව අපි මෙසේ සටහන් කරමු.

සම්පූර්ණ වීඩියෝව මෙතැනින්:
**https://www.facebook.com/219430344788805/posts/2405044459560705/**